
# ගුත්තිල කාව්‍ය රසවින්දනය





## ❖ගුත්තිල කාව්‍යයේ රචනා රීතිය,සම්ප්‍රදාය

❖ ජන කවි රීතිය :-

(වීණා තරගය )

කෙළෙහි ගුණ සින්දේ
මූසිල අන්ද මන්දේ
ජයෙහි ලොබ බැන්දේ
තමා වීණා තත ද සින්දේ

(287)



## ❖ ව්‍යක්ත කවි රීතිය (වියත් වහර/සකු රීතිය )
## (වෙණ මිහිර)

නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ
රුති ලෙස රුපුනොද බිඳ ජයගත්තෝ
පැතිරෙන වෙණ නද බැඳුණු සිතැත්තෝ
අතින`වි ගිලිහෙන බව නොම දත්තෝ

(293)



❖ සංවාද ස්වරූපය (ජන කවි රීතිය මත පිහිටා තිබීම)

(උදේනි පුර සැණකෙළිය)





නොමිහිරිද මේ        වෙණ
ඇසූවෙද මින් වැඩි        වෙණ
නැතහොත් නැත        නුවණ
කියව නොසතුටු වන්ට        කාරණ

ඇදුර තුටු        නොවෙතියි
නොසිත අප සිප්        නොදනියි
උනිමු වෙණ        සදතියි
නොදත්තෙමු ගායනා        කරතියි

(144-145)

## ❖ සම්භාව්‍ය කාව්‍ය රීතිය (උපමා, රූපක)

## (වීණා තරගය නැරඹීමට මණ්ඩපයක් ඉදිකිරීම)

සොඳ පුන් සඳ සොමි කිරණින් පිහිකුළු
වැද සුරගඟ රළ වට කළ සුළකුළු
නඳ සිරිසර පාමින් රන් ගිරිකුළු
ඇඳ පිරිසිදු සුදු සිනිඳු කසී සළු

(233)



❖ විචාරයට අත්වැලක් :-

1. සිව්පද කාව්‍යයේ මුදුන් මිණ
2. වියතුන්
3. පාණ්ඩිත්වය
4. වික්ෂෝපී
5. වදන්
6. සෝපාහාසාත්මක
7. රස නිෂ්පත්තිය
8. අවස්ථාවෝචිත
9. සංස්කෘත අලංකාරවාදී සිද්ධාන්ත
10. විශිෂ්ට
11. ශ්‍රේෂ්ඨ



## උපමා සහ රූපකාලංකාර භාවිතය:-

උපමා භාවිතය (93,94,95,96,97,109,128,138,140,142)

උදේනි පුර සැණකෙළි වර්ණනාව

රැගත් සුරා පිරූ විතින්
සුරත් තඹුරු පෙති සෙ නෙතින් (සුලභ උපමාවකි)
පුවත් නොදැන බමන ගතින්
නටත් අයෙක් සුරා මතින්

(122)





## උදේනි පුර සැණකෙළි වර්ණනාව

සැරයට ළං නොවන (නව්‍යතම උපමාවකි)
ලිහිණියකු අත් පහුරෙන
ගනිමියි තැත් කරන
එකකු මෙන් ගායනා කරමින

(140)



# වීණා වාදනයට සවන් දෙමු :-



## රූපකාර්ථ යෙදීම:-(103,107,106,109)

### මූසිල-ගුත්තිල ඇදුරින්දු හමුව:-

හිමි තම <u>නැණ</u> <u>නැවින්</u>
සැදි <u>ගී තරඟ</u> වෙසෙසින්
<u>වෙණ සිප් මහණැවින්</u>
කෙළේ ඔහු පරතෙරට මැනවින්

(170)





## ❖ පැරණි උපමා

පුන් මදාරා මල් දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා
මන්මදා කිතුලිය ලෙසින් උර තුර සරා දිලි මුතුලතා
මන් නදා වන මිණි මෙවුල් නද වෙන නදින් එක්කොට ඉතා
උන් එදා දුන් රඟ දුටොත් තව සක් සැපත් කවරෙක් පතා
(310)





# විචාරයට අත්වැලක්

- චිත්‍රණය කිරීම
- විරචිත
- ඖචිත්‍යය
- වාචිකාර්ථය
- ව්‍යංග්‍යාර්ථ
- ධ්වනිත කරයි
- අනුපමේය කවීත්වය
- කවිතාවේ සුලක්ෂණය
- රස උද්දීපනය
- කාව්‍යාලංකාර



❖ පාඩම පිළිබඳ ඔබට දැනෙන්නේ කෙසේ ද?

















## විචාර ප්‍රශ්න

1. සිව්පද කාව්‍යාවලියේ මුදුන් මිණ සේ සැලකෙන ගුත්තිල කාව්‍යයේ අවස්ථානුකූල ව කාව්‍ය රීති සුසංයෝජනය කර ඇති ආකාරය විමසන්න.

2. ප්‍රතිභාපූර්ණ කවිතාවෙන් යුතු වැත්තෑවේ හිමි කාව්‍යාලංකාර උපයුක්ත කරගනිමින් ගුත්තිල කාව්‍යයේ රස උද්දීපනය කර ඇති අයුරු විමසන්න.

# ඔබ සැමට ස්තූතියි

